විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS

ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions

පරපුරක අභිමානය          தலைமுறையொன்றின் பெருமிதம்          Pride of a Generation

මගේ අංකය / எனது இல. / My No. } විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි අංක: 07/2022 (II)

ඔබේ අංකය / உமது இல. / Your No. } ........................

දිනය / திகதி / Date } 2023.02.23

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්,
සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්,

<u>**විශ්‍රාමිකයන්ගේ ජීවිත සහතික - 2023**</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් ම විසින් නිකුත් කරන ලද 2022.12.13 දිනැති විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි 07/2022 හා 2022.12.30 දිනැති විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි 07/2022 (I) වෙත ඔබගේ අවධානය යොමු කරවමි.

02. එම ලිපි මගින් ග්‍රාම නිලධාරීන් වෙත නිකුත් කරන ලද ඇමුණුම 01 ආකෘතිය විශ්‍රාමිකයින් විසින් අත්සන් කර ග්‍රාම නිලධාරි විසින් සහතික කර 2023.02.15 දිනට ඔබ වෙත ලබා ගන්නා ලෙස දැනුම් දී ඇත. එලෙස ලබා ගත් ලේඛන අනුව විශ්‍රාම වැටුප් නිලධාරීන් විසින් දත්ත පද්ධතිය යාවත්කාලීන කළ යුතු වේ. එලෙස දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීමෙන් අනතුරුව ඒ වන තෙක් ග්‍රාම නිලධාරි වෙත ඉදිරිපත් වීමෙන් හෝ ඇඟිලි සලකුණ තැබීම මගින් ජීවිත සහතික යාවත්කාලීන කිරීමට අපොහොසත් වූ විශ්‍රාමිකයින්ගේ ලේඛනයක් දත්ත පද්ධතිය හරහා ලබාගැනීමට මේ වන විට පහසුකම් සලසා ඇත. එම ලේඛනය 2023.03.01 දිනට හෝ අදාළ ග්‍රාම නිලධාරි වසම යාවත්කාලීන කළ වහාම ග්‍රාම නිලධාරීන් වෙත නැවත ලබා දිය යුතු අතර ග්‍රාම නිලධාරි විසින් එම ලේඛනය සම්පූර්ණ කර 2023.03.31 දිනට ප්‍රාදේශීය ලේකම් වෙත භාර දී අවසන් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

03. යම් විශ්‍රාමිකයෙකු ආබාධිතභාවය, රෝගීභාවය හෝ වෙනත් යම් පෞද්ගලික කාරණයක් හේතුවෙන් තම ස්ථිර පදිංචි ග්‍රාම නිලධාරි වසමෙන් බැහැරව වාසය කරන අවස්ථාවක දී ජීවිත සහතික ලබා දීම සම්බන්ධයෙන් අදාළ විශ්‍රාමිකයාගේ ලිඛිත ඉල්ලීමක් ලබාගෙන දැනට තාවකාලිකව පදිංචි වසමේ ග්‍රාම නිලධාරි විසින් සහතික කර ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සනින් විශ්‍රාම වැටුප් ලිපිගොනු පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත යොමු කිරීමට කටයුතු කළ යුතුය. එවැනි ලිඛිත තහවුරුවක් විශ්‍රාම වැටුප් ලිපිගොනු පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලැබුණු පසු විශ්‍රාම වැටුප් නිලධාරීන් විසින් විශ්‍රාමිකයාගේ ජීවිත සහතිකය යාවත්කාලීන කළ යුතුය.

04. දත්ත පද්ධතියේ ස්වභාවය අනුව භාරකරුවන් මගින් විශ්‍රාම වැටුප් ලබාගන්නා විශ්‍රාමිකයාගේ තොරතුරු ඇමුණුම 01 ආකෘතියට ලබා ගැනීමේ දී විශ්‍රාමිකයා වෙනුවට භාරකරුවන්ගේ නම් ඇතුළත් වන අවස්ථා පවතින අතර එම අවස්ථාවන් හඳුනාගෙන භාරකරු වෙනුවට විශ්‍රාමිකයාගේ අත්සන ලබා ගැනීමට ග්‍රාම නිලධාරීන් දැනුවත් කළ යුතුය. වසමට අදාළව භාරකරුවන් පත් කර ඇති විශ්‍රාමිකයන් පිළිබඳ තොරතුරු හඳුනාගෙන ග්‍රාම නිලධාරීන් වෙත ලබා දීමට කටයුතු කළ යුතුය.

05. 2023.03.31 දිනට ග්‍රාම නිලධාරීන් වෙතින් මෙම ලේඛන නැවත භාර ගැනීම සහ 2023.04.12 දිනට ප්‍රථම එම තොරතුරු මත දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම සිදු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**ඒ.ජගත් ඩී. ඩයස්**
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්